සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**06 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019

**ගණිතය** **කාලය පැය දෙකයි**

නම/විභාග අංකය : ........................................................................ පන්තිය : ..............................

**වැදගත්**

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 6 කින් සමන්විතය
- නියමිත ස්ථානයේ ඔබේ නම/විභාග අංකය නිවැරදිව ලියන්න
- I කොටසෙහි ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නයට යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- II කොටසෙහි ප්‍රශ්න 6 කට පමණක් පිළිතුරු සපයන්න. ඒ සඳහා ඔබ විසින් සපයාගත් කඩදාසිවල පිළිතුරු සැපයිය යුතුයි.
- ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී අදාල පියවර හා නිවැරදි ඒකක දැක්වීම අත්‍යාවශ්‍යය
- පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

  I කොටසෙහි
  1-20 තෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින්

  II කොටසෙහි
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| ප්‍රශ්න අංකය | | ලකුණු |
|---|---|---|
| I කොටස | 1-20 | |
| II කොටස | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| | 7 | |
| මුළු එකතුව | | |
| ..................... ලකුණු කළේ | | ..................... සංකේත අංකය |
| ..................... පරීක්ෂා කළේ | | ..................... සංකේත අංකය |

## I කොටස


- ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

1. පැන්සල් 6 ක මිල රු. 120 කි. පැන්සලක මිල කීයද?

2. උතුරු දිශාවත් නැගෙනහිර දිශාවත් අතර පිහිටන දිශාව කුමක්ද?

3. එක්තරා දිනක පාසල් නොපැමිණි සිසුන් සංඛ්‍යාව 𝍸 𝍸 // ලෙස දක්වා ඇත. එදින පාසලට නොපැමිණි සිසුන් ගණන කීයද?

4. රූපයේ අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් කවර භාගයක් ද?



5. වට්ටක්කා ගෙඩියක ස්කන්ධය 3054 g කි. එය කිලෝග්‍රෑම් හා ග්‍රෑම් වලින් ලියා දක්වන්න.

6. 1,4,9,16, . . . , . . . මෙම සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක ලියන්න.

7. පහත දැක්වෙන දෑ කාණ්ඩ දෙකකට වෙන් කර ලියා එම කාණ්ඩ වලට සුදුසු නම් ද ලියන්න.

| ත්‍රිකෝණය, ඝනකාභය, චතුස්තලය, වෘත්තය, සෘජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, ඝනකය |
|---|

..................................................   ..................................................

8. 0 . 23 භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න.

9. පහත සංඛ්‍යා රේඛාවේ 4 හා (-2) යන සංඛ්‍යා නිරූපණය කරන්න.




10. සුළු කරන්න.


| | $l$ | $ml$ |
|---|---|---|
| | 2 | 420 |
| + | 3 | 680 |
| | | |

11. පෘථිවියේ සිට සිකුරු ග්‍රහයාට ඇති දුර 41120000 $km$ වේ. එම සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා එහි සංඛ්‍යා නාමය ද ලියන්න.

12. රූපයේ $a$ හා $b$ මගින් දැක්වෙන කෝණ කුමන වර්ගයේ කෝණ දැයි ලියා දක්වන්න.

$a$ ........................................................

$b$ ........................................................




13. කෙසෙල් කැනක ඇවරි 5 ක් ඇත. එක් ඇවරියක කෙසෙල් ගෙඩි 16 ක් ඇත්නම් කෙසෙල් කැනේ ඇති මුළු ගෙඩි ගණන නිමානය කරන්න.


14. පාසල ආරම්භ වන වේලාව හා අවසන් වන වේලාව පහත ඔර්ලෝසු වල දැක්වේ. එම වේලාවන් පැය 24 ඔරලෝසු වේලාව ඇසුරෙන් ලියා දක්වන්න.

ආරම්භක වේලාව



........................................................


අවසන් වන වේලාව



........................................................

15. සුළු කරන්න. 25.7 + 8.63

16.



මෙම තල රූප වල නම් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) සමචතුරස්‍රය, සමාන්තරාස්‍රය, ත්‍රපීසියම, රොම්බසය

(ii) සෘජුකෝණාස්‍රය, සමාන්තරාස්‍රය, රොම්බසය, ත්‍රපීසියම

(iii) සමචතුරස්‍රය, රොම්බසය, ත්‍රපීසියම, සමාන්තරාස්‍රය


(iv) රොම්බසය, සමචතුරස්‍රය, සමාන්තරාස්‍රය, ත්‍රපීසියම

17. 24 හි සාධක අතරින් ප්‍රථමක සංඛ්‍යා වන සාධක සියල්ලම ලියන්න

18. පොතක මිල රු. $a$ වේ. පෑනක මිල පොතක මිලට වඩා රු. 15 කින් අඩුය. පෑනක මිල වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.

19. කුමාරට තම පියාගෙන් රු. 500 ක මුදලක් ලැබුණි. ඔහු එයින් රු. 130 ක් මිලැති පොතක් ද, රු. 175 ක් වටිනා පැන්සල් පෙට්ටියක් ද මිලට ගත්තේය. ඔහු ළඟ ඉතිරි මුදල කොපමණ ද?

20. පහත රූපයේ වෘත්ත දෙකම මත පිහිටන ලක්ෂ 2 ක් නම් කරන්න.



## II කොටස

- ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) 14329 හි 3 ඉලක්කම මගින් නිරූපණය කරන අගය කීයද?

(ii) 9872 ÷ 16 , දීර්ඝ බෙදීමේ ක්‍රමයෙන් මෙහි පිළිතුර ලබා ගැනීම සඳහා පහත හිස්තැන් පුරවන්න.

```
      6□□
16 | 9872
     96
     □□
     16
     □□□
     1 1 2
       □
```

(iii) එක්තරා වැඩක් නිම කිරීමට කම්කරුවන් 8 දෙනෙකුට දින 5 ක් ගතවේ. කම්කරුවෙකුට දිනකට වැඩ කුලිය රු. 1200 ක් නම් වැඩ කුලිය සඳහා වැයවන මුළු මුදල සොයන්න.

2. ප්‍රාථමික පාසලක පසුගිය වසර 5 තුළදී ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් සිසුන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

| වර්ෂය | සමත් සිසුන් ගණන |
|---|---|
| 2014 | 16 |
| 2015 | 10 |
| 2016 | 24 |
| 2017 | 33 |
| 2018 | 35 |

(i) වෘත්තයකින් සිසුන් 4 දෙනෙක් නිරූපණය වන සේ මෙම තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක දක්වන්න.

(ii) වසර 5 තුළදී එම පාසලෙන් ශිෂ්‍යත්වය සමත් වූ මුළු සිසුන් ගණන කීයද?

(iii) අඩුම සිසුන් පිරිසක් සමත් වූයේ කුමන වර්ෂයේ ද?

(iv) 2015 වර්ෂයට වඩා 2018 වසරේ සමත් සිසුන් ගණන සොයන්න.

3. පළතුරු සලාදයක් සෑදීම සඳහා කෙසෙල් 3 $kg$ ක් ද, අඹ 1 $kg$ 500 $g$ ක් ද, පැපොල් 2 $kg$ ක් ද, අන්නාසි 1 $kg$ 200 $g$ ද යොදා ගන්නා ලදී.

(i) පළතුරු සලාදය සැකසීම සඳහා යොදාගත් පළතුරු වල මුළු ස්කන්ධය සොයන්න.

(ii) ඒ සඳහා යොදාගත් කෙසෙල් හා අඹ වල ස්කන්ධ අතර අනුපාතය සොයා එය සරලම ආකාරයෙන් දක්වන්න.

(iii) පළතුරු සලාදය සැකසීමේදී අපතේ ගිය ප්‍රමාණය 500 $g$ නම් සලාදයේ ඉතිරි ස්කන්ධය සොයන්න.

(iv) එය 50 දෙනෙකු අතරේ සමසේ බෙදා දෙන ලදී. එක් අයෙකුට ලැබුණු ප්‍රමාණය සොයන්න.

(v) ඉහත එක් අයෙකුට ලැබුණු ප්‍රමාණය ආසන්න 10ට වටයා ලියන්න.

4. (a) (i) $\frac{3}{4}$ හා $\frac{7}{12}$ යන භාග අතුරින් වඩා විශාල භාගය කුමක්ද?


(ii) සුළු කරන්න. $\frac{7}{9} - \frac{5}{9}$

(iii) නාමල් තම වැටුපෙන් $\frac{1}{2}$ ආහාර පාන සඳහා ද $\frac{1}{8}$ ක් ඇඳුම් පැළඳුම් සඳහා ද වැය කළේය. ඔහු ආහාර පාන හා ඇඳුම් පැළඳුම් සඳහා වැය කළ මුදල වැටුපෙන් කවර භාගයක් ද?

(b) (i) $\frac{7}{10}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න.

(ii) 3.3, 3.33, 0.3, 0.33, 3.03 ආරෝහණ පිළිවෙළට සකස් කර ලියන්න.


5. (a) චානුක තම නිවසේ සිට පාසලට ගමන් කරන මාර්ගය පහත දළ රූපයේ දක්වා ඇත.




(i) ඔහු නිවසේ සිට පාසලට යාමේදී B හිදී හැරෙන දිශාව කුමක්ද?

(ii) ඉහත B හිදී හැරෙන දිශාව උතුරු දිශාවේ සිට කුමන වර්ගයේ කෝණයක් සාදයිද?

(b) (i) පහත දී ඇති පතරොම භාවිතයෙන් සකස් කළ හැකි ඝන වස්තුවේ නම ලියන්න.



(ii) එහි මුහුණත්, දාර හා ශීර්ෂ ගණන ලියන්න.

(iii) එහි එක් මුහුණතක හැඩය කුමක්ද?

6. (a) (i) $16 = 4^{\square} = 2^{\square}$ නම් හිස් කොටු වලට ගැළපෙන අගයන් සොයන්න.

(ii) $2^3 \times 5^2$ විහිදුවා ලියා එහි අගය සොයන්න.


(b) කවකටු පෙට්ටියක මිල රු. $x$ වන අතර පොතක මිල රු. $y$ වේ.

(i) නිමාලි රු. 500 ක් දී කවකටු පෙට්ටියක් මිලට ගත්තාය. ඇයට ලැබුණු ඉතිරි මුදල වීජීය ප්‍රකාශනයක් මගින් දක්වන්න.

(ii) $x = 355$ නම් ඉහත (i) හි ලබාගත් ප්‍රකාශනයේ අගය සොයන්න.

(iii) සයුරී පොතක් මිලදී ගත් විට ඇයට රු. 10ක ඉතිරි මුදලක් ලැබුණි. ඇය ලඟ තිබු මුදල වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.


7. (i) කම්බියක් නැමීමෙන් සකස් කළ හැඩ තලයක් රූපයේ දැක්වේ. එහි පරිමිතිය සොයන්න.




(ii) ඉහත කම්බිය දිග හැර සම්පූර්ණ කම්බියම භාවිත කර දිග 7 $cm$ වූ සෘජුකෝණාස්‍රයක් සාදනු ලැබුවහොත් එහි පළල සොයන්න.

(iii) එම සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සොයන්න.


(iv) පහත රූපයේ අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න. (කුඩා කොටුවක වර්ගඵලය $1cm^2$ කි).



# අවසාන වාර පරීක්ෂණය - 2019
## ගණිතය පිළිතුරු පත්‍රය

06 ශ්‍රේණිය

## I කොටස

| ප්‍ර.අං | පිළිතුර | කොටසකට ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| 01. | $\frac{120}{6}$<br>= රු. 20 | 1<br>1 | 2 |
| 02. | ඊසාන (North East)<br>2 | 2 | |
| 03. | 12 | 2 | 2 |
| 04. | $\frac{3}{8}$ | 2 | 2 |
| 05. | 3 kg 54 g | 2 | 2 |
| 06. | 25, 36 | 2 | 2 |
| 07. | ත්‍රිකෝණයTriangle, වෘත්තය circle,<br>ඍජුකෝණාස්‍රයRectangle,<br>සමචතුරස්‍රය Square -<br>තල රූප Plane figures<br>ඝනකාභයcuboid, චතුස්තලයTetrahedron,<br>ඝනකයcube - ඝන වස්තු solids | 1<br><br>1 | 2 |
| 08. | $\frac{23}{100}$ | 2 | 2 |
| 09. |   | 2 | 2 |
| 10. | 6 *l* 100 *ml* | 2 | 2 |
| 11. | 41 120 000<br>හතළිස් එක් මිලියන එකසිය විසිදහස<br>Forty One Million One Hundred Twenty Thousand | 1<br>1 | 2 |
| 12. | a - මහාකෝණය obtuse angle<br>b - පරාවර්ත කෝණය reflex angle | 1<br>1 | 2 |
| 13. | 16 x 5<br>= 80 | 1<br>1 | 2 |

| ප්‍ර.අං | පිළිතුර | කොටසකට ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| 14. | 07 : 30<br>13 : 30 | 1<br>1 | 2 |
| 15. | 34. 33 | 2 | 2 |
| 16. | (iii) | 2 | 2 |
| 17. | 2 , 3 | 2 | 2 |
| 18. | a -15 | 2 | 2 |
| 19. | 175 + 130 = 305<br>500 - 305 = රු. 195 | 1<br>1 | 2 |
| 20. | A හා G | 2 | 2 |
| | **ගණිතය II කොටස** | | |
| 01. | i. 300<br>ii. 9872 ÷ 16 = 617 (16 \| 9872; 96; 27; 16; 112; 112; 0)<br>iii. රු. 1200x8x5 = 9600x5<br>= රු. 48000 | 2<br>4<br>4 | 10 |
| 02. | (පහත වගුව) | | |
| | ○ = 4<br>ii. 118<br>iii. 2015<br>iv. 35 - 10<br>= 25 | 5<br>2<br>1<br>1<br>1 | 10 |

| වර්ෂය | සිසුන් ගණන |
|---|---|
| 2014 | ○○○○ |
| 2015 | ○○◑ |
| 2016 | ○○○○○○ |
| 2017 | ○○○○○○○○ ◔ |
| 2018 | ○○○○○○○○◕ |

| ප්‍ර.අං | පිළිතුර | කොටසකට ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| 03. | i. kg g<br>3 000<br>1 500<br>2 000<br>1 200<br>7 700 | <br><br><br><br><br>3 | |
| | ii. කෙසෙල් : අඹ<br>Banana: Mango<br>3000 : 1500<br>2 : 1 | <br><br>1<br>1 | |
| | iii. 7700 g - 500 g<br>= 7200 g | 1<br>1 | |
| | iv. $\frac{7200}{50}$<br>144 g | 1<br>1 | |
| | v. 140 g | 1 | 10 |
| 04. | a. i. $\frac{9}{12}$ $\frac{7}{12}$ | 1 | |
| | විශාල භාගය the largest fraction $\frac{3}{4}$ | 1 | |
| | ii. $\frac{2}{9}$ | 2 | |
| | iii. $\frac{1}{2}+\frac{1}{8}=\frac{4}{8}+\frac{1}{8}$<br>$\frac{5}{8}$ | 2<br>1 | |
| | b. i 0.7 | 1 | |
| | ii. 0. 33, 3. 03, 3.3, 3. 33 | 2 | 10 |
| 05. | a. i. ගිණිකොණ South East | 2 | |
| | ii. මහා කෝණය obtuse angle | 2 | |
| | b. i. සවිධි චතුස්තලය regular tetrahedron | 2 | |
| | ii. මුහුණත් F-4 දාරE - 6 ශීර්ෂV - 4 | 2 | |
| | iii. සමපාද ත්‍රිකෝණය Equilateral Triangle | 2 | 10 |
| 06. | a. i. 16 = $4^{\boxed{2}} = 2^{\boxed{4}}$ | 2 | |
| | ii. 2 x 2 x 3 x 5 x 5<br>= 200 | 1<br>1 | |
| | b. i. රු. 500 - x | 2 | |
| | ii. 500 - 335<br>= 165 | 1<br>1 | |
| | iii. රු. y + 10 | 2 | 10 |
| 07. | i. cm mm<br>3 00<br>3 05<br>10 03<br>7 02<br>24 00 | <br><br><br><br><br>3 | |
| | ii. 24 - 14 = 10<br>10 ÷ 2 = 5 cm | 1<br>2 | |
| | iii. 7 x 5 = 35 $cm^2$ | 2 | |
| | iv. 6 $cm^2$ | 2 | 10 |